**2024-12-02 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ**

01. **2025 පෙබරවාරි මස 04 දිනට යෙදෙන 77 වන නිදහස් දින උත්සවය**

2025-02-04 දිනට යෙදෙන 77 වන නිදහස් දින සමරු උළෙල පැවැත්වීම හා එහි සංවිධාන කටයුතුවලට අදාළව මහපෙන්වීම, මෙහෙයවීම සහ අධීක්ෂණය සඳහා ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍ය මණ්ඩල කමිටුවක් පත් කිරීම පිණිස 2024-10-14 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසුව අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින් ලෙස පත් කරනු ලැබ ඇති අදාළ විෂයන් භාර අමාත්‍යවරුන් ද ඇතුළත් කරමින් 2025 පෙබරවාරි මස 04 දිනට යෙදෙන 77 වන නිදහස් දින සමරු උත්සවය සංවිධාන කිරීමට අදාළව අවශ්‍ය මඟ පෙන්වීම සඳහා ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ ගරු අග්‍රාමාත්‍යතුමියගේ සහභාගිත්වයෙන් අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් පත් කිරීම පිණිස රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

02. **ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ වන මාර්ග ව්‍යාපෘතිවලට 2024 වර්ෂය සඳහා පරිපූරක අයවැය ප්‍රතිපාදන ඉල්ලීම**

පසුගිය වකවානුවේදී රට තුළ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් විදේශ ණය මූල්‍යකරණය හරහා ක්‍රියාත්මක කළ ඇතැම් ව්‍යාපෘති සඳහා විදේශ ණය ලබා දීම තාවකාලිකව අත්හිටුවන ලද බැවින්, විදේශ ණය මූල්‍යකරණය යටතේ ලබා දුන් ප්‍රතිපාදන සම්පූර්ණයෙන් යොදා ගැනීමට නොහැකි විය. එසේම, අමුද්‍රව්‍ය මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ යාම හේතුවෙන් දේශීය මූල්‍යකරණය යටතේ දරන ලද වියදම් ද විශාල ලෙස ඉහළ ගොස් ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති බිල්පත් පියවීම සඳහා දැනට වෙන් කරනු ලැබ ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ගැටලු සහගත තත්ත්වයක් උද්ගත වී තිබේ. මෙම කරුණු පිළිබඳව ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සැලකිල්ලට ගනිමින්, 2024 වර්ෂය සඳහා ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ

සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය වෙත විදේශ ණය මූල්‍යකරණය යටතේ වෙන් කරනු ලැබ ඇති ප්‍රතිපාදන ඉතිරිවීම වෙනුවට දේශීය මූල්‍යකරණය යටතේ අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන සලසා ගැනීම පිණිස පරිපූරක ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

03. **රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සහ දේශීය ඖෂධ නිෂ්පාදකයින් වෙතින් අත්‍යවශ්‍ය වෛද්‍ය සැපයීම් ප්‍රසම්පාදනය**

දේශීයව නිෂ්පාදනය කරනු ලබන ඖෂධ සහ වෛද්‍ය සැපයීම් ඉදිරි වසරක කාලයක් සඳහා හඳුනාගනු ලැබ ඇති දේශීය නිෂ්පාදකයින් වෙතින් මිල දී ගැනීම පිණිස 2024-10-14 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සමඟ බද්ධ ව්‍යාපාර ගිවිසුම් අත්සන් කරනු ලැබ ඇති දේශීය නිෂ්පාදකයින්, සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ පසු මිල දී ගැනීමේ ගිවිසුම් අත්සන් කරනු ලැබ ඇති දේශීය නිෂ්පාදකයින් සහ දැනට ගිවිසුම්ගතවී නොමැති දේශීය නිෂ්පාදකයින් විසින් සැපයිය හැකි ඖෂධ වර්ග ලැයිස්තු 04ක් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් සකස් කර තිබේ. එම ලැයිස්තු 04 පරීක්ෂා කර අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශ මත පදනම්ව, පහත සඳහන් පරිදි ප්‍රසම්පාදනයන් පිරිනැමීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* ඖෂධ වර්ග 42ක් සැපයීමේ ප්‍රසම්පාදනය රුපියල් මිලියන 5,398.83ක මුදලකට රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව වෙත පිරිනැමීම.
* ඖෂධ වර්ග 131ක් සැපයීමේ ප්‍රසම්පාදනය රුපියල් මිලියන 16,611.42ක මුදලකට රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සමඟ බද්ධ ව්‍යාපාර ගිවිසුම් අත්සන් කරනු ලැබ ඇති දේශීය නිෂ්පාදකයින් වෙත පිරිනැමීම.
* ඖෂධ වර්ග 36ක් සැපයීමේ ප්‍රසම්පාදනය රුපියල් මිලියන 9,022.10ක මුදලකට සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය සමඟ පසු මිල දී ගැනීමේ ගිවිසුම් අත්සන් කරනු ලැබ ඇති දේශීය නිෂ්පාදකයින් වෙත පිරිනැමීම.

* ඖෂධ වර්ග 130ක් සැපයීමේ ප්‍රසම්පාදනය රුපියල් මිලියන 13,374.65ක මුදලකට අලුතින් තෝරාගත් දේශීය නිෂ්පාදකයින් 24ක් වෙත පිරිනැමීම.

**04. අග්‍රාමාත්‍ය කාර්යාලයේ අතිරේක ලේකම් තනතුරු සඳහා පත් කිරීම**

අග්‍රාමාත්‍ය කාර්යාලයේ දැනට පවතින අතිරේක ලේකම් තනතුරු පුරප්පාඩු 02ක් සඳහා පහත සඳහන් පරිදි පත් කිරීම් සිදු කිරීම පිණිස ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* දැනට කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අතිරේක දිස්ත්‍රික් ලේකම්වරයෙකු වශයෙන් සේවය කරනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි ජේ.එම්.අයි.ආර්.කේ.ජයසුන්දර මහතා අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලයේ අතිරේක ලේකම් තනතුරකට පත් කිරීම.

* දැනට මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරියක වශයෙන් සේවය කරනු ලබන ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I ශ්‍රේණියේ නිලධාරිනී චාන්දනී සාගරිකා බෝගහවත්ත මහත්මිය අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලයේ අතිරේක ලේකම් තනතුරක පූර්ණකාලීනව වැඩබැලීම සඳහා පත් කිරීම.

**05. මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති තනතුරට පත්කිරීම**

මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති තනතුර 2024-11-25 දින සිට පුරප්පාඩුව පවතී. එම තනතුර සඳහා දැනට අම්පාර ප්‍රාදේශීය ලේකම් ලෙස සේවය කරනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි යූ.පී.ඉන්දික අනුරුද්ධ පියදාස මහතා වහාම ක්‍රියාත්මක වන පරිදි පත් කිරීම පිණිස රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**06. පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක ලේකම් තනතුරට පත් කිරීම**

පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක ලේකම් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකු වශයෙන් දැනට සේවය කරනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරි එම්.ජී.සී.එස්.රණසිංහ මහතා වහාම ක්‍රියාත්මක වන පරිදි පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක ලේකම් තනතුරේ පූර්ණකාලීව වැඩබැලීම සඳහා පත් කිරීම පිණිස ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**07. රාජ්‍ය සේවයේ නියුතු සංවර්ධන නිලධාරින්, ආශ්‍රිත සේවාගණවල නිලධාරින් රාජ්‍ය සේවයට ඇතුළත් වීමට මූලික සුදුසුකමක් ලෙස උපාධිය සලකා නොබලන නමුත් උපාධියක් සහිතව රාජ්‍ය සේවයේ විවිධ තනතුරුවල දැනටමත් ඇතුළත් වී සිටින නිලධාරින් හා රාජ්‍ය සේවයට ප්‍රවේශ වීමට අපේක්ෂාවෙන් සිටින උපාධිධාරින් ආශ්‍රිතව පවතින ගැටලු හඳුනාගැනීම හා නිරාකරණය කිරීම**

1994 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අවස්ථා 07කදී විවිධ යෝජනා ක්‍රම මඟින් රාජ්‍ය සේවයට බඳවාගත් සංවර්ධන නිලධාරින් ඇතුළුව මධ්‍යම රජයේ සහ පළාත් සභා යටතේ උපාධිධාරින් 150,000කට අධික සංඛ්‍යාවක් සේවයේ නියුතුව සිටී. සංවර්ධන නිලධාරින්ගේ හා ආශ්‍රිත සේවා ගණයන්හි සේවය කරන නිලධාරින්ගේ නිපුණතා හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ නිසි ඇගයීමක් සිදු නොකර රාජ්‍ය සේවයට බඳවා ගැනීම් සිදු කර තිබේ. ඔවුන්ට සේවාරම්භක හා සේවාස්ථ පුහුණු නිසි පරිදි ලබා නොදීම හේතුවෙන් හා විධිමත් පරිදි තනතුරට අදාළ කාර්යයන් සහ වගකීම් පැවරීම සිදු නොකිරීම හේතුවෙන් එම නිලධාරින් වෙතින් අපේක්ෂිත කාර්යසාධනය ළඟා කර ගැනීමට නොහැකි වී ඇත. එසේම, සංවර්ධන නිලධාරින් 15,800කට අධික සංඛ්‍යාවක් ජාතික පාසල්වල සහ පළාත් පාසල්වල ඉගැන්වීම්වල නිරතව සිටින අතර, ඔවුන් ගුරු සේවයට බඳවා ගැනීම සම්බන්ධයෙන් ද මේ වන විට ගැටලුකාරී තත්ත්වයක් පැන නැගී තිබේ. ඒ අනුව, සංවර්ධන නිලධාරින්ගේ පරිපාලන කටයුතුවලදී මෙන්ම, කාර්යසාධනය සම්බන්ධව වර්තමානයේදී උද්ගත වී ඇති විවිධ ගැටලු හඳුනාගෙන, එම ගැටලු විශ්ලේෂණය කර ඒ සඳහා තිරසර විසඳුම් ඉදිරිපත් කිරීම පිණිස අග්‍රාමාත්‍යතුමියගේ සභාපතිත්වයෙන් සහ පහත සඳහන් අමාත්‍යවරුන්/නියෝජ්‍ය අමාත්‍යවරුන්ගෙන් සමන්විත අමාත්‍ය කමිටුවක් පත් කිරීමටත්, එම කමිටුවට සහාය වීම පිණිස අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුත් නිලධාරි කමිටුවක් පත් කිරීමටත් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

අමාත්‍ය කමිටුව:

* ගරු අග්‍රාමාත්‍යතුමිය - (සභාපති).
* ගරු රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා
* ගරු ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා.
* ගරු අධ්‍යාපන හා උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා.
* ගරු වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා.

නිලධාරි කමිටුව:

* අග්‍රාමාත්‍ය ලේකම් - (සභාපති)
* ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
* ලේකම්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
* ලේකම්, මුදල් කොමිෂන් සභාව
* ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්
* ආයතන අධ්‍යක්ෂ ජනරාල්
* අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
* ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

08. **2023 වසරේ පැවැත්වීමට නියමිතව තිබූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා කැඳවන ලද නාමයෝජනා ආපසු කැඳවීම සහ නව නාමයෝජනා කැඳවීම සඳහා විධිවිධාන සැලසීම**

2023 වසරේ පැවැත්වීමට නියමිතව තිබූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා කැඳවන ලද නාමයෝජනා ආපසු කැඳවීම සහ නව නාමයෝජනා කැඳවීම සඳහා විධිවිධාන සැලසීම පිණිස පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පතක් සකස් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීමට 2024-09-02 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කරනු ලැබ ඇත. මේ පිළිබඳව 2024-11-25 දින පාර්ලිමේන්තුවේ කථානායකතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද පිළිගත් දේශපාලන පක්ෂ නායකයින් ද සහභාගී වී ඇති පක්ෂ නායක රැස්වීමේදී 2023 වර්ෂයේ කැඳවන ලද නාම යෝජනා අවලංගු කර

අලුතින් නාම යෝජනා කැඳවා ඉදිරි පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවැත්විය යුතු බවට එකඟතාවකට පැමිණ තිබේ. ඒ අනුව, සියලු ඡන්ද හිමියන්ගේ ඡන්ද අයිතිය සහ තරුණ ප්‍රජාවගේ ඡන්දය සඳහා නාම යෝජනා ලබා දීමේ අයිතිය ආරක්ෂා වන පරිදි දැනට කැඳවා ඇති පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා වන නාම යෝජනා ආපසු කැඳවීමට සහ නව නාම යෝජනා කැඳවීම පිණිස විධිවිධාන සැලැස්වීමට හැකි වන පරිදි මැතිවරණ කොමිෂන් සභාව වෙත බලය ලැබෙන සේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් ලබා දීම සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 09. රාජ්‍ය ආයතනවලට විශාල වැය බරක් වන අධි සුඛෝපභෝගී වාහන විධිමත් ක්‍රමවේදයකට අනුව අපහරණය කිරීම

රාජ්‍ය ආයතනවල භාවිත වන ඇතැම් අධි සුඛෝපභෝගී වාහනවල නඩත්තු හා ඉන්ධන සඳහා වැය වන අධික පිරිවැය සැලකිල්ලට ගෙන, එවැනි අධි සුඛෝපභෝගී වාහන අපහරණය කිරීම ආර්ථිකව වඩාත් ඵලදායි වන බව පෙනී ගොස් ඇත. ඒ අනුව, සියලුම රාජ්‍ය ආයතනවල පවතින වාහන පිළිබඳව විධිමත් අධ්‍යයනයක් සිදු කර, රේගු සංකේතාංක 87.03 යටතට ගැනෙන පෙට්‍රල් එන්ජින් ධාරිතාව 1800ccට වැඩි වාහන සහ ඩීසල් එන්ජින් ධාරිතාව 2300ccට වැඩි වාහන (ඩබල් කැබ් / සිංගල් කැබ් / වෑන් රථ / බස් රථ හැර) නියමිත ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් 2025-03-01 දිනට පෙර අදාළ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් විසින් අපහරණය කිරීමටත්, ඒ අනුව කටයුතු කර මහා භාණ්ඩාගාරයේ කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත වාර්තා කිරීම සඳහා අදාළ චක්‍රලේඛ උපදෙස් නිකුත් කිරීම පිණිස භාණ්ඩාගාරයේ ලේකම් වෙත බලය පැවරීමටත් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 10. "Clean Sri Lanka" වැඩසටහන ක්‍රියාත්මක කිරීම

වර්තමානය වන විට ශ්‍රී ලංකාව ආර්ථිකමය වශයෙන් පමණක් නොව දේශපාලනික, සමාජයීය, අධ්‍යාත්මික මෙන්ම පාරිසරික වශයෙන්ද සැලකිය යුතු පසුබෑමකට ලක්වීම සැලකිල්ලට ගෙන මෙරට ජනතාවගේ යහපැවැත්ම, සංහිඳියාව සහ ප්‍රගමණය තහවුරු කිරීම තුළින් ජාතික අපේක්ෂාව සාක්ෂාත් කර ගැනීම සඳහා සිදු කරනු ලබන ජාතික

මෙහෙයුමක් ලෙස "Clean Sri Lanka" නමින් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. "පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්" යන නව රජයේ දැක්ම අනුව මෙහෙයවනු ලබන මෙම පරිවර්තනීය මූල පිරීම සාමාජීය, පාරිසරික හා ආචාරධර්මීය පිබිදීමක් ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක කෙරෙනු ඇත. මෙම වැඩසටහන ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කිරීමටත්, ඒ සඳහා ජනාධිපති කාර්යසාධක බලකායක් පිහිටුවීමටත්, වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අරමුදල් සම්පාදනය කිරීම පිණිස පාලක මණ්ඩලයක් මඟින් පාලනය කරනු ලබන "Clean Sri Lanka අරමුදල" නමින් අරමුදලක් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කිරීමටත් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **අස්වැසුම සුබසාධක ගෙවීම් යෝජනා ක්‍රමය සඳහා සංශෝධන හඳුන්වා දීම**

අස්වැසුම සුබසාධක ගෙවීම් යෝජනා ක්‍රමය 2023-07-01 දින සිට ක්‍රියාත්මක කර ඇති අතර, අංක 2384/30 දරන අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් නැවත සංශෝධනය කර 2024-07-01 දින සිට ක්‍රියාත්මක කර තිබේ. මෙම යෝජනා ක්‍රමය යටතේ අස්වැසුම සුබසාධක ප්‍රතිලාභී පවුල් සඳහා කාණ්ඩ 04ක් යටතේ ප්‍රතිලාභ හිමි ගැන්වේ. ආර්ථික අර්බුදයේ බලපෑම සම්පූර්ණයෙන් පහව ගොස් නොමැති බැවින්, සංක්‍රාන්තික සහ අවදානමට ලක් වූ කාණ්ඩවලට අදාළව පළමු වටයට තේරී ඇති පවුල් සහ තෝරා ගැනීමේ කටයුතු ආරම්භ කර ඇති දෙවන වටයේ අයදුම්පත්වලට අදාළව තෝරාගනු ලබන පවුල් සඳහා තවදුරටත් කෙටි කාලයකට සහන සැලසීමේ අවශ්‍යතාව පෙනී ගොස් ඇත. එමෙන්ම වත්මන් ජීවන වියදම සැලකූ විට දැනට ලබා දෙනු ලබන මුදල ප්‍රමාණවත් නොවන බවට ද කරුණු ඉදිරිපත්ව තිබේ. ඒ අනුව, දැනට බලපවත්නා අස්වැසුම සුබසාධක ගෙවීම් යෝජනා ක්‍රමය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* දුප්පත් හා අන්ත දිළිඳු සමාජ කාණ්ඩ සඳහා දැනට ගෙවනු ලබන මාසික ප්‍රතිලාභ දීමනාව පිළිවෙලින් රුපියල් 8,500/- සිට රුපියල් 10,000/- දක්වාත්, රුපියල් 15,000/- සිට රුපියල් 17,500/- දක්වාත් වැඩි කිරීම සහ

ඒ අනුව සංශෝධිත අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීම.

* සංක්‍රාන්තික සමාජ කාණ්ඩය සඳහා ප්‍රතිලාභ ගෙවන කාලසීමාව 2025-03-31 දින දක්වා වලංගු වන සේ දීර්ඝ කිරීම.

* අවදානමට ලක් වූ සමාජ කාණ්ඩය සඳහා ප්‍රතිලාභ ගෙවන කාලසීමාව 2025-12-31 දින දක්වා වලංගු වන සේ දීර්ඝ කිරීම.

## 12. අතුරු සම්මත ගිණුම - 2025

2025 වර්ෂයේ මුල් මාස 04ක කාලසීමාව සඳහා පාර්ලිමේන්තුව වෙත අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කිරීමටත්, ඒ සඳහා යෝජනා සම්මතයක් කෙටුම්පත් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් ලබා දීමටත් 2024-11-25 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව නීති කෙටුම්පත් සම්පාදක විසින් කෙටුම්පත් කර ඇති අතුරු සම්මත ගිණුම සඳහා වන යෝජනා සම්මතයට නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී යෝජනා සම්මතය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 13. පාසල් ලිපිද්‍රව්‍ය ලබා ගැනීම සඳහා පාසල් ළමුන්ට දීමනාවක් ලබා දීම

ආර්ථික අර්බුදයෙන් ඇති වූ අහිතකර ප්‍රතිඵල හේතුවෙන් පාසල් ළමුන්ගේ අධ්‍යාපනය කෙරෙහි සැලකිය යුතු සෘණාත්මක බලපෑමක් සිදුව ඇති බවත්, එය පාසල් ළමුන්ගේ 55%කගේ අධ්‍යාපනය කෙරෙහි අහිතකර ලෙස බලපා ඇති බවත් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබ ඇති සමීක්ෂණයක් මඟින් අනාවරණ වී ඇත. මෙම ප්‍රතිශතය ග්‍රාමීය හා වතු ආශ්‍රිතව වඩාත් ඉහළ අගයක් ගන්නා බවත්, බලපෑමට ලක් වූ ළමුන් අතුරින් 53.2%ක් පාසල් ලිපිද්‍රව්‍ය මිල දී ගැනීම අවම කර හෝ මුළුමනින්ම නවතා ඇති බවත්, 26.1%ක් පෙර භාවිත කරන ලද පාසල් ලිපිද්‍රව්‍ය නැවත භාවිත කිරීමට යොමු වී ඇති බවත් අනාවරණ වී තිබේ. එබැවින්, පාසල් ළමුන්ගේ අධ්‍යාපනය කෙරෙහි ඇති වී ඇති

අහිතකර බලපෑම අවම කිරීමේ අරමුණින් 2025 වසරේ අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට පෙර, පාසල් ලිපිද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා පහත සඳහන් පරිදි පාසල් ළමුන් සඳහා වූ දීමනාවක් ලබා දීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* අස්වැසුම හිමි පවුල්වල ළමුන් සඳහා පාසල් ලිපිද්‍රව්‍ය ලබා ගැනීම පිණිස එක් ළමයෙකුට රුපියල් 6,000/-ක දීමනාවක් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය හරහා ලබා දීම.

* අස්වැසුම වැඩසටහනට ඇතුළත් නොවන දෙමාපියන් අහිමි ළමුන්, මව හෝ පියා ආබාධිත පවුල්වල ළමුන්, ළමා නිවාසගත පාසල් වයසේ සිටින සියලුම ළමුන් සහ විශේෂ හේතු මත අසරණභාවයට පත් වී ඇති කාණ්ඩවලට අයත් ළමුන් සඳහා පාසල් ලිපිද්‍රව්‍ය ලබා ගැනීම පිණිස එක් ළමයෙකුට රුපියල් 6,000/-ක දීමනාවක් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය හරහා ලබා දීම.

14. **ආනයන පාලන බලපත්‍ර ලබා ගැනීමකින් තොරව සහල් ආනයනය කිරීම පිණිස අවසර ලබා දීම**

දේශීය වෙළෙඳපොළේ දැනට පවතින නාඩු සහල් සහ අනෙකුත් සහල් වර්ග හිඟය මෙන්ම පසුගිය දිනවල පැවති අධික වර්ෂාපතනය හේතුවෙන් වී වගාව සඳහා සිදුවී ඇති හානිය සැලකිල්ලට ගනිමින්, සහල් ආනයනය කිරීම සඳහා දැනට පවතින සීමාවන් තාවකාලිකව ඉවත් කිරීමේ යෝග්‍යතාව අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලන ලදී. ඒ අනුව, ආනයන පාලන බලපත්‍ර ලබා ගැනීමකින් තොරව 2024-12-20 දින දක්වා මෙරටට සහල් ආනයනය කිරීම සඳහා වහාම ක්‍රියාත්මක වන පරිදි අවසර ලබා දීමට තීරණය කරන ලදී.

**********